# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# බස්නාහිර පළාත

மாகாண கல்வித் திணைக்களம்
மேல் மாகாணம்

**Department of Education**
**Western Province**

ாகாண கல்விப் பணிப்பாளர்
Provincial Director of Education – 011 2868606

89, ''රන්මඟපාය'', කඩුවෙල පාර, බත්තරමුල්ල
89, "ரண்மகபாய" கடுவெல வீதி, பத்தரமுல்ல
89, '' Ranmagapaya '', Kaduwela Road, Battaramulla

දුරකථන පොදු / பொது தொலைபேசி / General Telephone – 011 2875893, 0112875895
ෆැක්ස් / தொலைநகல் / Fax – 011 2868606 (P.D E)
ඊ-මේල් / kp -அஞ்சல் / E-mail – pde@edudept.wp.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | බප/අපරි07/වා.ස්.මාරු/2023 | ඔබේ අංකය / உமது இல / Your No. | | දිනය / திகதி / Date | 2023/08/ |

බස්නාහිර පළාතේ සියලුම
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

<u>**ගුරු සේවයේ ස්ථාන මාරු 2024**</u>

බස්නාහිර පළාතේ සියලුම අධ්‍යාපන කලාපයන්හි ගුරු ස්ථානමාරු සිදුවිය යුත්තේ අධ්‍යාපන ලේකම්ගේ අංක 2007/20 හා 2007.12.13 දිනැති ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියට අනුකූලවය.

කලාපය තුල ස්ථාන මාරුවීම් සිදු කිරීමේදි ද කලාප ගුරුමාරු මණ්ඩලය විසින් සකස් කර ගන්නා නිර්නායකද ඉහත ගුරුමාරු ප්‍රතිපත්තියට අනුකූලව වන පරිදි සකස් විය යුතුය. තවද,වර්ෂය පුරා ගුරු සේවයේ ස්ථාන මාරුවීම් සිදු නොවිය යුතු අතර මේ සමග එවනු ලබන කාල රාමුව තුල කටයුතු කරන ලෙසත් දන්වමි.

එකම පාසලේ වසර 10 ට වඩා සේවය කළ ගුරුභවතුන්ගේ ස්ථාන මාරුවීම් ද මේ සමඟම ක්‍රියාත්මක කල යුතුය.තම පාසල්හි වසර 10 ට වඩා සේවය කරන ලද ගුරුභවතුන්ගේ තොරතුරු විදුහල්පති විසින් අදාල කලාප අධ්‍යක්ෂ වෙත අනිවාර්යයෙන් ඉදිරිපත් කිරිම සිදු කල යුතුය.

## 02.<u>ඉල්ලුම්පත් කැඳවීම</u>

වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම්පත් කැඳවීම 2023/08/31 දින වන විට අවසන් කළ යුතුය. මේ සම්බන්ධයෙන් විදුහල්පතිවරුන් හා ගුරු භවතුන් දැනුවත් කල යුතුය.නියමිත දිනට පසුව ඉදිරිපත් වන ඉල්ලුම්පත් භාර නොගත යුතුය. මේ සමග එවනු ලබන ඉල්ලුම්පත්‍රය අනුව සකස් කල ඉල්ලුම්පත් පමණක් මෙම වර්ෂයේදි භාවිත කළ යුතු අතර 2018/12/31 දිනෙන් පසු පත්වීම් ලැබු ගුරුභවතුන්ගේ ස්ථාන මාරු ඉල්ලුම්පත් භාර නොගත යුතුය. මෙම ඉල්ලුම්පත්‍රයේ පිටපතක් සියලුම විදුහල්පති වරුන් වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.

I. කලාපය තුල
II. අන්තර් කලාප
III. අන්තර් පළාත් හා
IV. ජාතික පාසල් යනුවෙන් ඉල්ලුම්පත් භාර ගත යුතුය.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

மாகாண கல்வித் திணைக்களம்
மேல் மாகாணம்

**Department of Education**
**Western Province**

ாகாண கல்விப் பணிப்பாளர்
Provincial Director of Education | 011 2868606

89, ''රන්මඟපාය'', කඩුවෙල පාර, බත්තරමුල්ල
89, "ரண்மகபாய" கடுவெல வீதி, பத்தரமுல்ல
89, '' Ranmagapaya '', Kaduwela Road, Battaramulla

දුරකථන පොදු
பொது தொலைபேசி
General Telephone | 011 2875893
0112875895

ෆැක්ස්
தொலைநகல்
Fax | 011 2868606 (P.D E)

ඊ-මේල්
kp -அஞ்சல்
E-mail | pde@edudept.wp.gov.lk


(2023/12/31 දිනට වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කල පළාත් සහා පාසල්හි ගුරු භවතුන්ට ජාතික පාසල් සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කල හැක.)

**03.ඉදිරිපත් කල යුතු ස්ථාන මාරු පිටපත් ගණන**

- කලාපය තුල (01)
- අන්තර් කලාප (01)
- අන්තර් පළාත් (05)
- ජාතික පාසල් (05)

  (අයදුම්පත් 05න් 04ක් කලාපය තුළ රඳවා තබාගෙන 01 අයදුම්පතක් පමණක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු අතර, එම අයදුම්පත් පළාත් මාරු මණ්ඩලයෙන් නිර්දේශ වුවහොත් පමණක් අදාළ ඉතිරි අයදුම්පත් කලාපයෙන් ගෙන්වා ගත යුතුය.)

**04. සංඛ්‍යා ලේඛන හා තොරතුරු ලබා ගැනීම.**

සෑම පාසලක් සම්බන්ධයෙන්ම පවත්නා ගුරු අතිරික්ත හා ගුරු ඌනතා තොරතුරු සහ 2023/12/31 දිනට වසර 10 කට වඩා එකම පාසලේ සේවය කළ ගුරුභවතුන්ගේ තොරතුරු ලබා ගත යුතුය. එම තොරතුරු ලබා ගැනීමේදී පහසුවෙන් හඳුනාගත හැකි වන පරිදි වැඩිම සේවා කාලයක් සහිත ගුරුභවතුන්ගේ නම් පළමුවත්, ක්‍රමයෙන් සේවා කාලය අඩුවන පිළිවෙලට අනිකුත් අයගේ නම් සඳහන් කරමින් සේවා කාලය අනුව නාම ලේඛනය විද්‍යුත්පතිගෙන් ලබා ගත යුතුය.

**05. කලාප මාරු මණ්ඩල රැස්වීම්.**

I.ගුරු මාරු අයදුම්පත් ඉදිරිපත් කරන 2023/08/31 දිනට පෙර කලාප ගුරු මාරු මණ්ඩලය රැස් වී අදාල වසර සඳහා නිර්නායක සකස් කල යුතුය.

II. ගුරු මාරු අයදුම්පත කලාපය වෙත ලැබුණු විගස එහි දින මුද්‍රාව සටහන් කළ යුතුය.

III.ලැබී ඇති සියළුම ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් සලකා බලා තීරණ ගැනීම සඳහා කලාප මාරු මණ්ඩල 2023/09/03 දින සිට 2023/11/01 අතර කාලය තුල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/ නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක (පාලන)ගේ ප්‍රධානත්වයෙන් වරින් වර රැස්විය යුතුය. පසුගිය වසර දෙකේදී ඇතැම් කලාපයන්හි ස්ථාන මාරු ක්‍රියාවලිය සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි වාර්තාවීම අසතුටුදායක කරුණක් බැවින් මාරු මණ්ඩලයේ නිර්දේශය ඇතිව පමණක් කටයුතු කිරීම අවධාරණය කෙරේ.

மாகாண கல்விப் பணிப்பாளர்
Provincial Director of Education | 011 2868606

89, ''රන්මඟපාය'', කඩුවෙල පාර, බත්තරමුල්ල
89, "ரண்மகபாய" கடுவெல வீதி, பத்தரமுல்ல
89, '' Ranmagapaya '', Kaduwela Road, Battaramulla

දුරකථන පොදු
பொது தொலைபேசி
General Telephone | 011 2875893 / 0112875895

ෆැක්ස්
தொலைநகல்
Fax | 011 2868606 (P.D E)

ඊ-මේල්
kp -அஞ்சல்
E - mail | pde@edudept.wp.gov.lk

## 06. ස්ථාන මාරු ඉල්ලුම්පත් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට යොමු කිරීම.

අන්තර් කලාප,අන්තර් පළාත් හා ජාතික පාසල් සඳහා ස්ථානමාරු ඉල්ලා සිටින ගුරු භවතුන්ගේ අයදුම්පත් පිළිබඳ තීරණ ගැනීමට කලාප ගුරු මාරු මණ්ඩලය 2023 සැප්තැම්බර් 01ත් 2023 සැප්තැම්බර් 30 ත් අතර කාලය තුල රැස්විය යුතු අතර එහිදී නිර්දේශ ලබන අයදුම්පත් 2023/10/10 දිනට පෙර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

කලාප මාරු මණ්ඩලයේ නිර්දේශ සටහන් කිරීමෙන් තොරව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත එවන අයදුම්පත් පිළිබඳව ඉදිරි කටයුතු සිදු නොකරන බවද දන්වමි.

සෑම ඉල්ලුම්පත්‍රයකම දකුණු පස උඩ කෙලවරේ රතු තීන්තෙන් <u>අනු අංකය/වර්ෂය/හා කුමන ස්ථාන මාරු වර්ගයකට අයත්ද</u> යන්න සටහන් කළ යුතුය.

අන්තර් පළාත් ස්ථාන මාරු ඉල්ලා සිටින ගුරු භවතුන්ගේ අයදුම්පත්හි වල <u>ගුරු භවතාට එරෙහිව විනය පරීක්ෂණ තිබේද/ විගණන විමසුම් තිබේද හා සේවය ස්ථිර කර තිබේද යන්න අයදුම්පතේ අදාල ස්ථානයේ පැහැදිලිවම</u> සටහන් කල යුතුය.

සියළුම අයදුම්පත් අනිවාර්යයෙන්ම මේ සමග ඇති ආකෘති 1,2,3 අනුව වෙන වෙනම උපලේඛනගත කර ලිපිගොනු 03 ක් ලෙස ඉදිරිපත් කල යුතුය.
**(වැදගත් : ගුරු භවතා නිදහස් කරන්නේ අනුප්‍රාප්තිකයෙකු සහිතවද, රහිතවද යන්න පමණක් පැහැදිලිව සටහන් කල යුතුය.)**

## 07.ස්ථාන මාරු ලිපි නිකුත් කිරීම.

කලාපය තුල ස්ථාන මාරු සිදු කිරීමේදී පාසල්හි ගුරු ඌනතා සමනය වන අයුරින් හා අතිරික්තය තුලනය වන පරිදි කටයුතු කිරීමට වග බලා ගත යුතුය. කලාපය තුල වාර්ෂික ස්ථානමාරු ලිපි 2024/02/21 දිනට ක්‍රියාත්මක වන පරිදි 2024/01/08 දිනට පෙර නිකුත් කළ යුතුය.

## 08. අභියාචනා භාර ගැනීම.

අභියාචනා මණ්ඩලය විසින් සියළුම අභියාචනා 2024/01/22 දින සිට 2024/01/31 දින අතර වු කාලය තුළ සලකා බලා තීරණ සහිත ලිපි 2024/02/13 දිනට පෙර නිකුත් කළ යුතුය.

## 09. සංඛ්‍යා ලේඛන හා තොරතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත දැන්වීම.

සියළුම ගුරු ස්ථාන මාරුවීම් ලිපි නිකුත් කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව වාර්තාවක්ද,ස්ථාන මාරු කිරීමෙන් අනතුරුව ඇතිවී තිබෙන ඌනතා හා අතිරික්ත පිළිබඳ ලේඛනයක්ද මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම නොපමාව කළ යුතුය.

ඒ අනුව අතිරික්ත ගුරුභවතුන් කලාපය තුල ඌණතා පිරවීම සඳහා යොදා ගැනීමට නියමිතය. එසේම වෙනත් පළාත් වලින් බස්නාහිර පළාතට බඳවා ගන්නා ගුරුවරුන්ගෙන් හා නව උපාධි පත්වීම් හා විද්‍යාපීඨ පත්වීම් මගින් ඌණතා පිරවීමට කටයුතු කරනු ඇත. කෙසේ වෙතත් කලාපය තුල ගුරු ඌනතා, කලාප ගුරුමාරු මණ්ඩලය සමග සාකච්ඡා කර කලාපය තුලම අතිරික්ත වන ගුරුභවතුන්ගෙන් හැකිතරම් දුරට සපුරා ගැනීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ වගකීම වේ.

## 10.අන්තර් පළාත් ගුරුමාරු

බොහෝ දුෂ්කර ප්‍රදේශවල දිගු කාලයක් සේවය කර බස්නාහිර පළාතේ තම ගම් ප්‍රදේශවල සේවය කිරීමේ අපේක්ෂාවෙන් පැමිණෙන ගුරුවරුන්ට සහන සැලසීම වශයෙන් ඔවුනට වඩා පහසු හා ප්‍රියමනාප පාසල් ලබා දීමද අවශ්‍ය වේ.එම නිසා කලාප තුල ගුරුභවතුන් ස්ථානගත කිරීමේදී ඒ පිළිබඳවද අවධානය යොමු කල යුතුය.

## 11.එකම පාසලේ වසර 10 ක සේවා කාලයක් ඇති ගුරු භවතුන් මාරු කිරීමේදී අනුගමනය කළ යුතු කරුණු - (මේ සමඟ ඇති වසර 10 ඉල්ලුම්පත්‍රයේ ආකෘතිය අනුගමනය කරන්න.)

01. බස්නාහිර පළාතේ සියළුම කලාපයන්හි ගුරු සේවයේ ස්ථාන මාරුවීම් ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියට අනුකූලව සිදු කළ යුතුය.
02.ගුරුභවතුන් ස්ථානමාරු කිරීමේදී හැකිතාක් දුරට සංස්කෘතිකමය ගැටළු මතුනොවන පරිදි ස්ථාන ගත කිරිමට කටයුතු කල යුතුය.

03. වසර 10 ක සේවා කාලය ගණන් ගැනීමේදී ජනප්‍රිය පාසැල් කීපයක වුවද,සේවා කාලයන් එකතුව වසර 10 ක් ඉක්මවන්නේ නම් ,එවැනි අයද වසර 10 ඉක්මවූ අය ලෙස සැලකේ.

04. කිසියම් ගුරු භවතෙකු තම සේවා කාලය තුලදී දුෂ්කර සේවාවන් සිදු නොකර තිබේ නම් එවැනි අය කලාපය තුල කිසියම් දුෂ්කරතාවයක් ඇති පාසල් වෙත ස්ථාන මාරු කළ යුතුය.

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# බස්නාහිර පළාත

மாகாண கல்வித் திணைக்களம்
மேல் மாகாணம்

# Department of Education
# Western Province

மாகாண கல்விப் பணிப்பாளர்
Provincial Director of Education } 011 2868606

දුරකථන පොදු
பொது தொலைபேசி
General Telephone } 011 2875893 0112875895

ෆැක්ස්
தொலைநகல்
Fax } 011 2868606 (P.D E)

ඊ-මේල්
மின்னஞ்சல்
E-mail } pde@edudept.wp.gov.lk

89, ''රන්මඟපාය'', කඩුවෙල පාර, බත්තරමුල්ල
89, "ரண்மகபாய" கடுவெல வீதி, பத்தரமுல்ல
89, '' Ranmagapaya '', Kaduwela Road, Battaramulla


**05**. ආසන්න ජනප්‍රිය පාසල් අතර ගුරු භවතුන් ස්ථාන මාරු නොකළ යුතුය. සුහද මාරු සඳහාද මෙය අදාල වේ. කලාපය තුල ජනප්‍රිය පාසල් පොකුරු ලෙස කොට්ඨාස මට්ටමෙන් හඳුනාගෙන එම පාසල් අතර ස්ථාන මාරු නොකළ යුතුය. කලාප ගුරු මාරුමණ්ඩලය විසින් හඳුනාගන්නා ලද එම ජනප්‍රිය පාසල් පර්ෂද(පොකුරු) පිළබඳව ලේඛනයක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නොපමාව ලබා දිය යුතුය.

**06**. මීගමුව,මතුගම,කොළඹ කලාපයන්හි සේවය කරන එහෙත් පිටස්තර කලාපයන්හි ස්ථිර පදිංචිකරුවන් වන ගුරුභවතුන් 2024 වසර සඳහා අන්තර් කලාප හෝ අන්තර් පළාත් ගුරුමාරු ඉදිරිපත් කර ඇත්නම් ඔවුන් 2023/12/31 අදාල පාසලේ වසර 10 ක කාලසීමාවක් සේවය කර ඇති වුවද කලාපය තුල ස්ථානමාරු වීම් වලට ලක් නොකළ යුතුය. එවැනි ගුරුභවතුන් පිළිබඳව පළාත් ගුරු මාරු මණ්ඩලය විසින් ලබා දෙන නිර්දේශ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ලබා දෙනු ලැබේ. එහෙත් එකම පාසලේ සේවා කාලය වසර 11 ක් හො ඊට වැඩිනම් මෙම සහනය හිමි නොවේ.

**07**. 2023 වසර පළමු ශ්‍රේණිය සහ තුන්වන ශ්‍රේණිය සඳහා ඉගැන්වීම්හි නිරත ගුරු භවතුන් වසර 10 ක සේවා කාලයක් ඉක්මවා ඇතත් ස්ථාන මාරු වීම් වලට ලක් නොකල යුතුය. එසේ රඳවා ගත් ගුරුභවතුන් ඊළඟ වසරේදී ස්ථාන මාරු කල යුතුය. ආසන්න වසර දෙකක කාලය තුල එක් වසරකදී 1 හෝ 3 ශ්‍රේණි සඳහා ඉගැන්වීම් කටයුතු සිදු කරන ගුරු භවතුන් සඳහා පමණක් මෙසේ ස්ථාන මාරුවීම් ලබා නොදී තැබිය හැකිය. එසේ වුවද 2023 වසරේ 1 හා 3 ශ්‍රේණි සඳහා ඉගැන්වීම් කටයුතු සිදු කරන ගුරු භවතුන් 2023/12/31 දිනට වසර 10 සම්පූර්ණ වී ඇත්නම් දස අවුරුදු ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කලයුතු අතර එසේ ස්ථාන මාරු වීම් වලට ලක් නොකරන ගුරු භවතුන්ගේ නාම ලේඛනයක් කලාප ගුරු මාරු මණ්ඩලය විසින් පිළියෙල කළ යුතුය.

**08**. වසර 10 ක ස්ථාන මාරු වලට ලක්වූ ගුරුවරයෙකු නැවත වසර 05 ක් යනතුරු කුමන හේතුවක් මත හෝ පෙර සේවය කල පාසලට ස්ථානමාරු හෝ අනුයුක්ත කිරීම් නොකල යුතුය. එසේ වුවද කලාප ගුරු මාරු මණ්ඩලය විසින් හඳුනාගත් දුෂ්කර පාසලක සේවයට නැවත පැමිණීමට මෙය අදාල නොවේ.

**09**. පෙනෙන ආබාධිත තත්වයන්, සුවිශේෂි වු රෝගී තත්වයන් හා දිගු කාලීන වෛද්‍ය සායන සටහන් පිළිබඳව මාරු මණ්ඩලය සෑහීමකට පත්වන අවස්ථාවකදී එවැනි ගුරු භවතුන් හට සහනදායී ලෙස ස්ථාන මාරු මණ්ඩල තීරණ ක්‍රියාත්මක කල හැකිය.

**10**. ගර්භනී අවස්ථාවේ පසුවන ගුරු මහත්මීන් සහ 2024/02/29 වන විට අවුරුදු 01 ට අඩු දරුවන් සිටින ගුරු මහත්මීන් සඳහා ස්ථාන මාරු ලබා දිය යුත්තේ ඔවුන් ඉල්ලා සිටින්නේ නම් පමණි.(මෙය අදාල ලේඛන මගින් සනාථ කල යුතුය.)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත
மாகாண கல்வித் திணைக்களம்
மேல் மாகாணம்
Department of Education
Western Province
மாகாண கல்விப் பணிப்பாளர்
Provincial Director of Education - 011 2868606
89, ''රන්මඟපාය'', කඩුවෙල පාර, බත්තරමුල්ල
89, "ரண்மகபாய" கடுவெல வீதி, பத்தரமுல்ல
89, '' Ranmagapaya '', Kaduwela Road, Battaramulla
දුරකථන පොදු
பொது தொலைபேசி
General Telephone - 011 2875893, 0112875895
ෆැක්ස්
தொலைநகல்
Fax - 011 2868606 (P.D E)
ඊ-මේල්
kp -அஞ்சல்
E-mail - pde@edudept.wp.gov.lk

**11**. 2023/12/31 දිනට වයස අවු.55 ක් සම්පූර්ණ කල හෝ අවු.55 ඉක්මවූ ගුරු භවතුන්ට ඔවුන්ගේ ලිඛිත කැමැත්තකින් තොරව ස්ථාන මාරු ලබා නොදිය යුතුය. එසේ වුවද විශ්‍රාම ගැන්වීමේ වයස පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සංශෝධනයක් සිදු කරන අවස්ථාවක දී මේ පිළිබඳව ඉදිරියේදී දැනුවත් කෙරෙනු ඇත. පෙර වසර වලදී දස අවුරුදු සේවා කාලය සපුරා තිබිය දී හා වයස අවුරුදු 55 ආසන්නව තිබිය දී නොයෙක් හේතූන් මත ස්ථාන මාරු නොකල ගුරු භවතුන් සිටීනම් මේ වන විට වයස අවුරුදු 55 සම්පූර්ණ වී ඇතත් එම ගුරු භවතුන් හට ස්ථාන මාරු ලබා දීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රමවේදයක් කලාප ගුරු මාරු මණ්ඩලය විසින් සකස් කල යුතුය.

**12**. මෙයට පෙර දස අවුරුදු ස්ථාන මාරු ලද ගුරු භවතෙකු නැවත දස අවුරුදු ස්ථාන මාරුවකට ලක් වීමේදී අදාල දස අවුරුදු කාල සීමාව ගණනය කරනු ලබන්නේ ස්ථාන මාරු ලද පාසලේ වැඩ භාරගත් දිනය නොව එම ගුරු භවතා ස්ථාන මාරුවට ලක් කරන ලද ලිපියේ දිනයවේ.

ඒ.ජී. නිමල් ජයවීර
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත.

**පිටපත් :-**

01.ලේකම් - රා.සේ.කො (බ.ප)
02.පළාත් අධ්‍යාපන ලේකම් (බ.ප)
03.අධ්‍යාපන වෘත්තීය සමිති ප්‍රධාන ලේකම්වරුන් - දැ.ගැ.පි හා 2023/2024 වර්ෂය සඳහා මාරු මණ්ඩල නියොජිතයින්ගේ නාම ලේඛන (පළාත් සහ කලාප 2024/08/31 දිනට පෙර පළාත් අධ්‍යාපන ලේකම් වෙත ලබා දීම සඳහා.